ජනාධිපති කාර්යාලය
ஜனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/SD/GS/උපදෙස් පත්‍රිකා
තිරසර සංවර්ධන අංශය
2017 අගෝස්තු මස 18 වන දින

ග්‍රාමශක්ති උපදෙස් පත්‍රිකා අංක 01
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු
සියළුම දිස්ත්‍රික් ලේකම්වරු

**ග්‍රාමශක්ති ව්‍යාපාරයට සම්බන්ධ රජයේ නිලධාරීන් හා ප්‍රජාව පුහුණු කිරීම**

ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ කාර්යසාධනය විධිමත්ව හා ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා පහත දැක්වෙන කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවමු.

1. ප්‍රාදේශීය ලේකම්/ සහාකාර ප්‍රාදේශීය ලේකම් හා සහාකාර අධ්‍යක්‍ෂ (සැලසුම්) යන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුවක් පැවැත්වීම.

2. යෝජිත ප්‍රජා පාලිත ගම් වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම (දෙදින වැඩමුළුවක්).

3. එම පුහුණු හා දැනුවත් කිරීම් සඳහා පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) හා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්‍ෂවරු ප්‍රමුඛ පුහුණුකරුවන් ලෙස ක්‍රියාකිරීම.

4. නිෂ්පාදන හා සේවා ප්‍රවර්ධන ගම්මානවලට සම්බන්ධ සංවර්ධන නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම.
ග්‍රාමශක්ති වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් අධීක්‍ෂණය කිරීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ වගකීම වේ.

5. පුහුණුවීම් හා ගම් මට්ටමේ සජීවිකරණ කටයුතු සඳහා සම්පත් දායක සංචිතයක් දිස්ත්‍රික් මට්ටමින් පවත්වාගෙන යෑම. දිස්ත්‍රික් ලේකම්ගේ උපදෙස් පරිදි ප්‍රාදේශීය මට්ටමේදී අවශ්‍ය සම්පත්දායක සේවාවන් සැපයීම හා ඔවුන්ට අවශ්‍ය පුහුණුව දිස්ත්‍රික් මට්ටමින් ලබා දීම.

6. සංවර්ධන නිලධාරීන් අවශ්‍ය වන ග්‍රාම නිලධාරීවසම් වලට සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් පරිදි ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරනු ලැබේ.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones 011 2354354, 011 4354354
ෆැක්ස් / தொலைநகல் / Fax 011 2340340
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail ps@presidentsoffice.lk

7. ප්‍රජා පාලිත ගම්වල ග්‍රාමීය ඉතුරුම් හා ණය සංවිධානයක් පිහිටුවන බැවින් ඒ සඳහා සුළු මූල්‍ය පුහුණුව විශේෂයෙන් ලබාදෙනු ලැබේ. සුළු මූල්‍ය විශේෂඥයෙකු විසින් සියළුම සංවර්ධන නිලධාරීන්ට මෙම පුහුණුව ලබා දීම සිදුකෙරේ.

8. පුහුණුවීම් කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අවශ්‍යතාව අනුව ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ.

9. කරුණාකර ඉහත අංක 01 හා 02 පුහුණු හැකි ඉක්මණින් අවසන් කිරීමට කටයුතු කරන්න. අංක 07 යටතේ ඇති සුළු මූල්‍ය පුහුණුව සඳහා ඔබ දිස්ත්‍රික්කයට අදාල දින යථා කාලයේදී ඔබ වෙත යොමු කරනු ලැබේ.

10. පළාත් ග්‍රාමශක්ති මෙහෙයුම් කමිටුව ප්‍රධාන ලේකම්ගේ මෙහෙයවීමෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පළාත් මට්ටමින් පැවැත්විය යුතුය.දිස්ත්‍රික් ග්‍රාමශක්ති මෙහෙයුම් කමිටුව දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අදාල පාර්ශවකරුවන්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්විය යුතුය.

11. දිස්ත්‍රික් මට්ටමින් මෙම වැඩ සටහනේ ප්‍රගතිය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අවශ්‍ය පරිදි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළ යුතු අතර ප්‍රාදේශීය මට්ටමේදී ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළ යුතුය.

ජයන්ත විජේරත්න
ජනාධිපති අතිරේක ලේකම්
ජනාධිපති ලේකම් වෙනුවට
O/C

පිටපත : ජනාධිපති ලේකම් : කාරුණික දැන ගැනීම සඳහා
ලේකම් : ස්වදේශ කටයුතු අමාත්‍යාංශය : කාරුණික දැන ගැනීම සඳහා
ලේකම් : පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය : කාරුණික දැන ගැනීම සඳහා